# සමජයීය පිළිගැනීම

ගම්පෙරළිය උසස් කෘතියක් ලෙස හඳුන්වනු ලැබුයේ එය බටහිර සාහිත්‍ය විචාර ඉගෙනගත් සිංහලයන්ගේ කැමැත්ත දිහාගත් බැවින් පමණක් නොව ඒ බටහිර සාහිත්‍ය විචාර හැදෑරූ අයට මෙරට සාහිත්‍ය ක්‍ෂෙත්‍රයෙහි දේශපාලන බලයක් ද තිබුණු හෙයිනි. වෙනත් වචනවලින් කියන්නේ නම් බටහිර සාහිත්‍ය විචාරවලට මෙරට පිළිගැනීමක් තිබුණු බැවිනි. මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ ගැහැණියක් කෘතිය පළවන අවධියෙහි සිංහල පාඨකයන් අතර බටහිර සාහිත්‍ය විචාර ක්‍රමවලට පිළිගැනීමක් නො තිබුණි. එබැවින් ගැහැණියක් කෘතියට ද සිංහල පාඨක සමාජයෙහි පිළිගැනීමක් නො තිබුණි.

අප බොහෝවිට සිතන්නේ කෘතියකට නෛසර්ගික අගයක් ඇති බව ය. අප එසේ සිතන්නේ වෙන කරුණක් නිසා නොව අපට එසේ සිතීමට පුරුදු කර ඇති බැවිනි. එහෙත් සාහිත්‍ය හෝ සිනමා හෝ විද්‍යා හෝ කෘතියකට අගයක් හා පිළිගැනීමක් ලැබෙන්නේ යම් නිශ්චිත සමාජයක හෝ සමාජවල හෝ මිස ඕනෑම සමාජයක නො වේ. ගැහැණියක් කෘතියට එදා ඒ පළවූ කාලයෙහි සිංහල සමාජයෙහි පිළිගැනීමක් නොතිබුණත් අද පිළිගැනීමක් ඇත්තේ එදා මෙදා තුර සිංහල සමාජය වෙනස් කෙරී ඇති බැවිනි.

විසිවැනි සියවසේ මුල සිංහල බෞද්ධයන් අතර ජාතක පොතට තිබූ පිළිගැනීම අද නැත්තේ ද සිංහල බෞද්ධ සමාජය වෙනස් කෙරී ඇති බැවිනි. අද ජාතක පොත තවදුරටත් අපේ ජීවිත හැඩගස්වන පොතක් නො වේ. ඒ දැන් ඇතැම් විටෙක සාහිත්‍ය කෘතියක් ලෙස අගය කෙරෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා වැරදි මඟක ගොස් ජාතක කතා බටහිර කෙටි කතා සමග ද සංසන්දනය කෙළේ ය. සිංහල සමාජය වෙනස් කෙරෙන්නේ බටහිර අධ්‍යාපනය හා දැන්නම් ප්‍රධාන වශයෙන් ම ජනමාධ්‍යය විසින් බව බොහෝ දෙනාට නො තේරෙයි.

සිංහල සමාජයේ තිබූ ආඛ්‍යාන (කතා කීමේ) රීතිය වෙනස්කිරීමට බටහිර අධ්‍යාපනය විසින් කටයුතු සිදු කෙරිණි. අපේ ආඛ්‍යාන රීතියක් නැතිවා නො වේ. ඒ රීතිය අනුව පොත් පළකරනනන් අද විරල වූ නමුත් තවමත් ඔවුන් නැත්තට ම නැති වී නැත. අපට අද සාහිත්‍යයෙහි තිබෙන ප්‍රධාන ම සම්පත මේ කිහිප දෙනා ය. ඔවුන් සොයා ඔවුන් වර්ධනය කිරීම අපේ යුතුකම වුවත් එපමණින් ඔවුන්ට සමාජයෙහි පිළිගැනීමක් ලැබේ යැයි නොසිතිය යුතු ය. සමාජයෙහි පිළිගැනීම ලැබෙන්නේ අළෙවි වන පොත් සංඛ්‍යාව අනුව නො වෙයි.

යම් කෘතියකට පිළිගැනීම පළමුව ලැබෙන්නේ ඊනියා උගත් සමාජයෙහි ය. එහෙත් ඒ උගත් සමාජය අද දවසේ කෘති අගයන්නේ කෘතිය කියවීමෙන්වත් නො වේ. ඊනියා ප්‍රසිද්ධ පුද්ගලයන් කියා ඇති දේ මතක තබාගෙන ඒ පුනරුච්චාරණය කිරීමෙන් අද දවසේ අවශ්‍ය නම් සාහිත්‍ය විචාරකයකු විය හැකි ය. ඒ ඊනියා විචාරකයන් පිළිගන්නා කෘතියක් සමාජයේ ද පිළිගත් කෘතියක් ලෙස සැලකෙයි.

මෙහි දී පිළිගැනීම යනුවෙන් කියැවෙන්නේ යම් උසස් මට්ටමක කෘතියක් ලෙස පිළිගැනීම ය. කලින් සඳහන් කර ඇති පරිදි පොතක අළෙවි වන පිටපත් සංඛ්‍යාව අනුව එහි පිළිගත්බව තීරණය නො වෙයි. පොතක් අළෙවි වන්නේ ඊනියා ඉහළ රුචිකත්වයක් ඇති සමාජයෙහි නොවිය හැකි ය. කලින් සඳහන් කළ විචාරකයන් විසින් උසස් මට්ටමේ සාහිත්‍ය කෘතියක් ලෙස නොසැළකුණු කෘතියක් වුව ද විශාල වශයෙන් අලෙවි විය හැකි ය. සමාජයේ යම් පිරිසක් කෘතිය පිළිගෙන ඇති බව පැහැදිළි ය. නැතහොත් කෘතිය අළෙවි නො වේ. එහෙත් කෘතියක් පිළිගත් කෘතියක් වන්නේ ඒ යම් උසස් මට්ටමක ඇති බව ඊනියා නිල විචාරකයන් පිළිගත් පසු ය.

සාහිත්‍යයෙහි පමණක් නොව වෙනත් ක්‍ෂෙත්‍රවල ද තත්වය එබඳු ය. බටහිර විද්‍යාවේ ද ඕනෑම අදහසක් ඒ කෙතරම් න්‍යායික (තර්කානුකූල) වුව ද, කෙතරම් සංගත වුව ද පිළිගැනීමට ලක්නොවී තිබිය හැකි ය. එයට හේතුව බටහිර විද්‍යාවේ අදහස් පිළිගැනෙන්නේ ඒ හා සම්බන්ධ නිල විමර්ශකයන් ඒ අදහස් පිළිගන්නේ නම් පමණක් වීම ය. එහි දී ඒ විමර්ශකයෝ නව අදහස් කෙතරම් දුරට පවතින සුසමාදර්ශය සමඟ එකඟවන්නේ දැයි සොයා බලති. නව අදහස් පවතින සුසමාදර්ශය සමග එකඟ නොවන්නේ නම් ඒ පළකරගැනීම මහත් අසීරු කාර්යයක් වෙයි.

© Prof. Nalin De Silva

සාහිත්‍යයේ දී නිල විචාරකයන් කරන්නේ ද අර විමර්ශකයන් කරන කාර්යයන්ට සමාන්තර වූවකි. නිල විචාරකයන් බලන්නේ කෘතිය තම සාහිත්‍ය විචාර මිනුම් දණ්ඩට එකඟ ද නැත් ද යන්න ය. මිනුම් දණ්ඩට එකඟ නම් ඵ කෘතිය උසස් කෘතියක් වෙයි. එසේ නැතහොත් ඵ කෘතිය සාහිත්‍ය කෘතියක් ද යන ප්‍රශ්නය වුව ද නඟන්නට ඉඩ ඇත. පියදාස සිරිසේන මහතාගේ කෘති සාහිත්‍යයට අයත් නොවන්නේ යැයි ඇතැමුන් තීරණය කෙළේ ඵ කෘතිවල ආඛ්‍යාන රීතිය, එනම් කතාව කීමේ ක්‍රමය බටහිර සාහිත්‍යයේ ආඛ්‍යාන රීතිය සමඟ එකඟ නොවුණු බැවිනි.

සාහිත්‍යයේ උපයෝගී කරගැනෙන සාහිත්‍ය විචාර වේවා, විද්‍යාවේ යොදා ගැනෙන සුසමාදර්ශ වේවා තීරණය කෙරෙන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මිස සිංහල බෞද්ධ හෝ වෙනත් සංස්කෘතියක හෝ නො වෙයි. එසේ තීරණය කෙරෙන්නේ බටහිර රටවල පමණක් වී නම් අපට ප්‍රශ්නයක් මතු නොවෙයි. එහෙත් මේ සුසමාදර්ශ, සාහිත්‍ය මිනුම් දඬු ලෝකයේ සෑම රටකට ම පොදු වෙයි. වෙනත් වචනවලින් කියන්නේ නම් අද මුළු ලෝකය පුරාම භාවිතා වන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මිනුම් දඬු ය. එනම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පිළිගැනෙන දේ අද මුළු ලෝකයෙහි ම පිළිගැනෙන දේ බවට පත්කෙරී ඇත.

මෙරට උගත්තු මහත් අභිරුචියෙන් කරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් නියම කෙරෙන මිනුම් දඬු යොදා ගැනීම මිස අනෙකක් නො වේ. විශ්වවිද්‍යාල පද්ධතිය හා පාසල් පද්ධතිය විසින් අවසාන විග්‍රහයෙහි දී කෙරෙන්නේ ඵ මිනුම් දඬු තහවුරු කිරීම ය. එහි දී බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අනුගමනය කරන ප්‍රධාන උපක්‍රමය නම් දැනුම නිරපේක්ෂ යැයි පැවසීම ය. ඊනියා යථාර්ථය, වාස්තවිකත්වය, ආදී සංකල්ප යොදාගනිමින් කොහේවත් නැති විද්‍යාත්නක විධික්‍රමයක් ගැන කතාකරමින් බටහිරයෝ තම සංස්කෘතියේ නිර්මාණය කෙරී ඇති දැනුම ලෝකයට ම පොදු ඊනියා වාස්තවික දැනුමක් බවට පත්කරති.

බටහිරයෝ එසේ කරද්දී දේශපාලන බලය ද යොදාගනිති. එමෙන් ම අවශ්‍ය නම් ආර්ථික තහංචි වුව ද පනවනු ඇත. මෙතෙක් බටහිර දැනුම ප්‍රචලිත කිරීම සඳහා ආර්ථික තහංචි පැනවීමට අවශ්‍ය වී නැත්තේ දේශපාලන හා සංස්කෘතික බලය පමණක් යොදා ගෙන ඵ කළ හැකි වීම නිසා ය. අපේ රටේ පාසල් පද්ධතිය හා විශ්වවිද්‍යාල පද්ධතිය පිහිටුවීමේ දී යොදාගෙන ඇත්තේ ද දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍ය ය.

එහෙත් එවැනි පද්ධතියක් පිහිටුවාගැනීමෙන් පසු යම් යම් ආර්ථික උපක්‍රම යොදා ගෙන බටහිර දැනුම තහවුරු කිරීමට කටයුතු කෙරෙයි. ඵ ආර්ථික උපක්‍රම හුදෙක් අල්ලසක් සංතෝසමක් දීමක් පමණක් බවට පත්වෙයි. ඵ ආර්ථික තහංචි පැනවීමක් නො වෙයි. විශ්වවිද්‍යාලවල හෝ ඊනියා පර්යේෂණ ආයතනවල හෝ රජයේ හා වෙනත් ආයතනවල හෝ ගුරුවරුන් නිලධාරීන් වැනි අයට ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරෙන්නේ ඵ පුද්ගලයන් තම ඒජන්තයන්, නියෝජිතයන් ලෙස පවත්වාගෙන යෑමේ වුවමනාවට මිස වෙනත් කරුණකට නො වේ.

අද ලෝකය පුරා සම්මන්ත්‍රණ වැඩමුළු ආදිය පවත්වන්නේ මේ ඒජන්තයන්ට විදේශ සංචාරවලට මඟ විවෘතකිරීමට හා එමගින් අල්ලසක් දීමට ය. අනෙක් පැත්තෙන් ඵ ඵ රටවල බටහිර දැනුම තව තවත් ප්‍රචලිත කිරීමට හා තහවුරු කිරීමට ය. මෙරට බටහිර විද්‍යා ක්ෂේත්‍රයෙහි නියැළුණු බොහෝ දෙනා මේ ප්‍රකාශයට විරුද්ධ වනු ඇත. ඔවුන් එයට විරුද්ධවීම තේරුම්ගත හැකි ය. එහෙත් මේ කෙළවරක් නැති සම්මන්ත්‍රණ හා වැඩමුළුවලින් බටහිර විද්‍යා දැනුමේ නිම් වළළු කෙතෙක් පුළුල් වී ඇත් ද යන්න ඔවුන්ට ප්‍රශ්නයක් විය යුතු ය.

මාර්ටින් වික්‍රමසිංහ මහතා නවකතා කෙටිකතා ලිවීමෙන් කර ඇත්තේ අන් කිසිවක් නොව බටහිර සාහිත්‍යය මෙරටට හඳුන්වාදීම ය. ඔහු කෙතරම් මෙරට සංස්කෘතිය ගැන කතාකළ ද එහි අදීනත්වය ගැන සඳහන් කළ ද ඔහු අවසන් වශයෙන් කර ඇත්තේ බටහිර සාහිත්‍යය, බටහිර පරිණාමවාදය ආදිය මෙරටට හඳුන්වාදීමත් බටහිර සංස්කෘතියෙහි ඇති ඊනියා යථාර්ථය ආදී සංකල්ප මෙරට සංස්කෘතියෙහි ද ඇති බවට වැරදි මතයක් ප්‍රචලිත කිරීමත් ය. වික්‍රමසිංහ මහතා මෙරට බිහිවූ ඉහළම බුද්ධිමතකු ලෙස හැඳින්වෙන්නේත් කොග්ගල ප්‍රාඥයා ආදී වශයෙන් ගරු බුහුමන් ලබන්නේත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් ඔහු විසින් කරන ලද සේවය හේතුකොට ගෙන ය.

© Prof. Nalin De Silva

මෙයින් කියැවෙන්නේ ඒ මහතා දක්‍ෂකයකු නොවූ බව නො වෙයි. එහෙත් මෙරට බිහිවන සෑම දක්‍ෂයකුට ම රවැනි පිළිගැනීමක් නො ලැබෙයි. පිළිගැනීමක් ලැබීමට නම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් යම් විශේෂ කාර්යභාරයක් ඉටුකළ යුතු ය. අද මෙරට මතවාදී හා සංස්කෘතික ආධිපත්‍යය ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ය. ඒ ආධිපත්‍යය පිළිගෙන එයට සේවය කරන්නන්ට පමණක් පිළිගැනීමක් ලැබීම ගැන පුදුම නොවිය යුතු ය. වික්‍රමසිංහ මහතා බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ආධිපත්‍යය නො පිළිගෙන පියදාස සිරිසේන මහතා මෙන් කටයුතු කෙළේ නම් සරච්චන්ද්‍ර මහතා විසින් ඔහු නොසළකා හැරෙනු ඇත. අනෙක් අතට සරච්චන්ද්‍ර මහතාට ආධිපත්‍යයක් ලැබුණේ ද ඒ මහතා බටහිර අච්චුවේ අනුකාරක විශ්වවිද්‍යාලයක කථිකාචාර්යවරයකු වීම නිසාත් ඒ මහතා ද බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ආධිපත්‍යය පිළිගැනීම නිසාත් ය.

මෙයින් අදහස්වන්නේ වික්‍රමසිංහ, සරච්චන්ද්‍ර ආදී මහතුන්ට ජාතිකත්වයක් නොතිබූ බව නො වෙයි. සරච්චන්ද්‍ර මහතාගේ ජාතිකත්වය ඉන්දියාව ඔස්සේ පැමිණි අතර වික්‍රමසිංහ මහතාගේ ජාතිකත්වය ඉන්දියාවට විරුද්ධව පැන නැගුණි. ඒ දෙදෙනාට ම ආවේණික ජාතිකත්ව වූ නමුත් ඒ ක්‍රියාත්මක වූයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සීමා තුළ ය. සරච්චන්ද්‍ර මහතා බටහිර සාහිත්‍ය විචාරයට අමතර ව බටහිර දර්ශනය ද පිළිගත්තේ ය. ඔහු ඉහළ ගණයේ දාර්ශනිකයකු නොවුව ද බෞද්ධ සංජානනය දෙස බැලුවේ බටහිර දෘෂ්ටි කෝණයකින් ය. අප මේ සියල්ල පවසන්නේ ඒ මහතුන්ට අගෞරවයක් කිරීමට නොව ඒ මහතුන්ට හා වෙනත් අයට හා ඔවුන්ගේ කෘතිවලට මෙරට සමාජයේ පිළිගැනීමක් ලැබුණේ කෙසේ ද යන්න තේරුම් ගැනීමට ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva